
## චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ

# ටූනා මත්ස්‍යය බිම් පුරෝකතන සේවාව

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන
නියෝජිතායතනය




Service credits: "Generated using E.U. Copernicus Marine Service Information. GMI data are produced by Remote Sensing Systems and sponsored by NASA Earth Science funding

# බහුදින යාත්‍රා සඳහා මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබඳ පුරෝකථනය

## නිකුත්කල දිනය : 2021-11-15

| දේශාංශ | | | අක්ෂාංශ | | | පන්න ගැඹුර |
|---|---|---|---|---|---|---|
| අංශක | මිනිත්තු | | අංශක | මිනිත්තු | | බඹ |
| 85 | 15 | E | 14 | 40 | N | 33 |
| 85 | 40 | E | 14 | 20 | N | 33 |
| 86 | 30 | E | 14 | 00 | N | 32 |
| 84 | 45 | E | 14 | 45 | N | 37 |
| 85 | 00 | E | 11 | 10 | N | 38 |
| 85 | 35 | E | 13 | 20 | N | 40 |
| 65 | 20 | E | 01 | 05 | N | 57 |
| 69 | 15 | E | 01 | 00 | N | 44 |
| 78 | 00 | E | 00 | 40 | N | 55 |
| 59 | 20 | E | 00 | 00 | N | 41 |
| 78 | 35 | E | -01 | 20 | S | 41 |
| 78 | 55 | E | -01 | 45 | S | 39 |

මෙම නිර්දේශය වලංගු වන්නේ නිකුත් කල දින සිට දින 3-5 දක්වා පමණි.

0112 520193 / 0112 520367

WhatsApp 070 272 3990

**බහු දින යාත්‍රා සඳහා කාලගුණ අනාවැකිය**
**උතුරු අක්ෂාංශ 20 ත් දකුණු අක්ෂාංශ 10 ත් සහ නැගෙනහිර දේශාංශ 60 ත් 100 ත් අතර මුහුදු ප්‍රදේශය සඳහා**

**(2021 නොවැම්බර් මස 15 දින, ඉදිරි දින තුන සඳහා නිකුත් කරන ලදී.)**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශ

**දකුණු අන්දමන් මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව පැවති අඩු පීඩන කලාපය මේ වනවිට මධ්‍යම අන්දමන් මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව පවතී. මෙය වර්ධනය වෙමින් බස්නාහිරට බරව වයඹ දෙසට ගමන් කරමින්, නොවැම්බර් 17 දින පමණ වනවිට බටහිර-මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේදී පීඩන අවපාතයක් බවට පත්විය හැකි අතර පසුව මෙම පද්ධතිය තවදුරටත් වර්ධනය වෙමින් බස්නාහිරට බරව වයඹ දෙසට ගමන් කර, නොවැම්බර් 18 දින පමණ වනවිට ඉන්දියාවේ දකුණු අන්ද්‍රා ප්‍රදේශ් වෙරළ වෙත ගමන් කිරීමේ වැඩි හැකියාවක් පවතී.**

වැසි තත්ත්වය:
**කන්කසන්තුරය සිට මන්නාරම, පුත්තලම කොළඹ හරහා ගාල්ල දක්වා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.**
සුළඟ:
**දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත හෝ බස්නාහිර දෙසින් හමා එයි. සුළගේ වේගය පැ.කි.මී. (40-50) පමණ වේ. කන්කසන්තුරය සිට මන්නාරම, කොළඹ, ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (55-60) පමණ දක්වා වැඩි විය හැකියි.**

මුහුදේ ස්වභාවය:
**කන්කසන්තුරය සිට මන්නාරම, කොළඹ, ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු විය හැකි අතර සෙසු මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක.**

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය

**දකුණු අන්දමන් මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව පැවති අඩු පීඩන කලාපය මේ වනවිට මධ්‍යම අන්දමන් මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව පවතී. මෙය වර්ධනය වෙමින් බස්නාහිරට බරව වයඹ දෙසට ගමන් කර නොවැම්බර් 17 දින පමණ වනවිට බටහිර-මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේදී පීඩන අවපාතයක් බවට පත්විය හැකි අතර පසුව මෙම පද්ධතිය බස්නාහිරට බරව වයඹ දෙසට ගමන් කර, නොවැම්බර් 18 දින පමණ වනවිට ඉන්දියාවේ දකුණු අන්ද්‍රා ප්‍රදේශ් වෙරළ වෙත ගමන් කිරීමේ වැඩි හැකියාවක් පවතී.**

**දිවයිනට නැගෙනහිරින් වන ගැඹුරු මුහුද ආශ්‍රිතව ක්‍රියා කරන ධීවර සහ නාවික ප්‍රජාව මේ පිළිබඳව සහ ඉදිරි කාලගුණ නිවේදන කෙරෙහි අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

කාලගුණික තත්ත්වය:

| | |
|---|---|
| 10N-15N, 80E-100E | : බොහෝ ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| 00-10N, 80E-100E | : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |

සුළං තත්ත්වය :

| | |
|---|---|
| 00-10N, 80E-90E | : නිරිත දෙසින් / පැ.කි.මී (30-40); විටින් විට පැ.කි.මී (50-60) දක්වා. |
| 10N-15N, 85E-100E | : වාමාවර්තව / පැ.කි.මී (30-40); විටින් විට පැ.කි.මී (50-60) දක්වා. |
| 15N-20N, 80E-100E | : ඊසාන දෙසින් / පැ.කි.මී (20-40); විටින් විට පැ.කි.මී 50 දක්වා. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : නිරිත දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව / පැ.කි.මී (15-30). |

මුහුදේ ස්වභාවය:

| | |
|---|---|
| 00-10N, 80E-90E | : තරමක් රළු, විටින් විට රළු. |
| 10N-15N, 85E-100E | : තරමක් රළු, විටින් විට රළු. |

15N-20N, 80E-100E : මද වශයෙන් රළු, විටින් විට තරමක් රළු.
සෙසු මුහුදු ප්‍රදේශ : සාමාන්‍ය ස්වභාවයේ සිට මඳ වශයෙන් රළු දක්වා.

<u>අරාබි මුහුද</u>

කාලගුණික තත්ත්වය:

07N-15N, 70E-78E : බොහෝ ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
03N-07N, 60E-80E : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
15N-18N, 70E-75E : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ප්‍රධාන වශයෙන් වැසි රහිත.

සුළං තත්ත්වය:

00-05N, 60E-80E : නිරිත දෙසින් / පැ.කි.මී (35-45); විටින් විට පැ.කි.මී (55-65) දක්වා.
05N-15N, 70E-80E : වයඹ සිට බස්නාහිර දක්වා දිශාවලින් / පැ.කි.මී (35-45); විටින් විට පැ.කි.මී (55-65) දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : උතුරේ සිට වයඹ දක්වා දිශාවලින් / පැ.කි.මී (20-30).

මුහුදේ ස්වභාවය:

00-05N, 60E-80E : තරමක් රළු, විටින් විට රළු දක්වා.
05N-15N, 70E-80E : තරමක් රළු, විටින් විට රළු දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : සාමාන්‍ය ස්වභාවයේ සිට මඳ වශයෙන් රළු දක්වා.

<u>දකුණු ඉන්දියානු සාගරය</u>

කාලගුණික තත්ත්වය:

05S-10S, 70E-100E : බොහෝ ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
00-05S, 85E-100E : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

සුළං තත්ත්වය:

05S-10S, 60E-75E : ගිනිකොන දිශාවෙන් / කි.මී (20-40).
05S-10S, 75E-90E : දක්ෂිණාවර්තව / කි.මී (20-30).
00-10S, 60E-100E : නිරිත සිට වයඹ දක්වා දිශාවලින් / කි.මී (20-35).
සෙසු මුහුදු ප්‍රදේශ : වයඹ දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව / කි.මී (15-25).

මුහුදේ ස්වභාවය:

00-03S, 60E-95E : මද වශයෙන් රළු සිට තරමක් රළු දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : සාමාන්‍ය ස්වභාවයේ සිට මඳ වශයෙන් රළු දක්වා.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට තද සුළං සමඟ එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

කාලගුණ විද්‍යාඥ
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව